www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# වොෂිංටනය “ත්‍රස්ත විරෝධී යුද්ධය” ප්‍රවර්ධනය කරනු පිනිස මුම්බායි ප්‍රහාරය ගසාකයි

## Washington exploits Mumbai attack to promote "war on terror"

**2008 දෙසැම්බර් 4**

එක්සත් ජනපද රාජ්‍ය ලේකම් කොන්ඩලීසා රයිස් බදාදා නව දිල්ලිය කරා ගුවනින් ගියාය. ඇගේ සංචාරයේ අරමුන ලෙස පෙන්නුම් කෙරුනේ පසුගිය සතියේ මුම්බායි සොලවාලූ ත්‍රස්තවාදී ප්‍රහාරවල දී ඝාතනයට ලක්වූ මිනිසුන් 173 දෙනා වෙනුවෙන් එක්සත් ජනපදයේ ශෝකය පල කිරීම සහ ඉන්දියාවේ ජනතාව සමග සහයෝගය ප්‍රකාශ කිරීම යි.

ඉරාකයේ හා ඇෆ්ඝනිස්ථානයේ ආක්‍රමනික යුද්ධ ඇමරිකානු ජනතාව මත පැටවීමෙහි ලා සහ එක්සත් ජනපදයේ වධබන්ධන හා එහි දේශපාලන විරුද්ධවාදීන් පැහැර ගෙන ලෝකයේ වෙනත් ප්‍රදේශවල රහස් රැඳවුම් කඳවුරුවලට රහසේ ප්‍රවාහනය කිරීමේ අත්‍යසමාන වැඩපිලිවෙල ක්‍රියාවලට දැමීමෙහි ලා ඇය ඉටු කල ක්‍රියාකලාපය හේතු කොට ගෙන යුද අපරාධ පිලිබඳ අධිචෝදනා ලැබීමට සුදුසු තැනැත්තියක වන රයිස්ගේ අවසන් ප්‍රධාන ජාත්‍යන්තර මූලිකත්වයන් අතරට මෙම සංචාරය වැටීමට ඉඩ ඇත.

දහස් සංඛ්‍යාත ලෙබනන් සිවිල් වැසියන් ඝාතනය කල 2006 ඊස්රායල යුද්ධය සාමයේ “විලි රුදාව” ලෙස වර්නනා කිරීම නිසා ඇය කුප්‍රකට වී සිටින මැද පෙරදිග විරෝධතාකරුවන් ඇමරිකානු රාජ්‍ය ලේකම්වරිය නිරන්තරයෙන් චිත්‍රනය කරන්නේ, සිය දල ලෙයින් පෙගුනු වැම්පයර් කෙනෙකු ලෙස ය.

දකුනු ආසියාවට ඇය කරන වත්මන් කඩාවැදීම සඳහා ද මෙම ප්‍රතිරූපය මැනවින් ගැලපෙන සංකේතයකි. එහි දී ඇය ඉදිරියට තල්ලු කරන්නේ, වොෂිංටනය සිය භූ-මූලෝපායික අවශ්‍යතා හඹා යනු වස් යොදා ගන්නා ඊනියා “ත්‍රස්ත විරෝධී ගෝලීය යුද්ධය” ප්‍රවර්ධනය කිරීම පිනිස මුම්බායි ප්‍රහාරයට ගොදුරු වූ අහිසංකයන්ගේ රුධිරය ගසාකෑමේ වොෂිංටනයේ ප්‍රයත්නයකි.

නව දිල්ලියේ දී කල කතාවක දී, රයිස් පකිස්ථානය මත පැහැදිලිව ම පීඩනය යෙදුවේ, එහි ආන්ඩුව “අධිෂ්ඨානවත්ව හා හදිසි භාවයකින් යුක්තව ක්‍රියාකල යුතු සහ මුලුමනින් ම හා පාරදෘශ්‍යව සහයෝගී විය” යුතු බව ප්‍රකාශ කරමිනි. ඔවුන්ගේ පාර්ශ්වයෙන්, පකිස්ථානය ත්‍රස්ත ප්‍රහාර හෙලා දැක ඒවාට සිය රාජ්‍ය ඒජන්සිවල මොනම සම්බන්ධයක් වත් ප්‍රතික්ෂේප කර තිබේ.

රයිස් අල් කයිඩා සහ මුම්බායි ප්‍රහාර අතර නොපවතින සම්බන්ධයක් ගැන යෝජනා කලේ මෙසේ ප්‍රකාශ කරමිනි: “මෙය පැහැදිලිව ම අල් කයිඩා සහභාගි වන ආකාරයේ ත්‍රස්ත ක්‍රියාවක්.” එම ප්‍රකාශය ඉවත් කර ගැනීමට ඇයට පසුව බල කෙරුනු නමුත්, ඇය දිගට ම ප්‍රකාශ කලේ ඉන්දියාවේ වානිජ අගනුවරට පහර දුන් අයත් නිව් යෝර්ක් හා වොෂිංටනයට 2001 දී එල්ල වූ ත්‍රස්ත ප්‍රහාරයට වගකිව යුතු අයත් “එකම කව තුල සැරිසරන” බවයි.

මුම්බායි ප්‍රහාර සහ සැප්තැම්බර් 11 ප්‍රහාර අතර සම්බන්ධයක් පවතී නම්, එය සොයා ගත යුත්තේ ඇමරිකානු ප්‍රතිචාරය තුල ය. ලෝක වෙලඳ මධ්‍යස්ථානයට හා පෙන්ටගනයට ගුවන් යානා කඩා වැදී මාස හතකට පසුව, රයිස් එම ඛේදජනක සිද්ධීන් විස්තර කලේ, “නව බල තුලනයක් නිර්මානය කිරීමට “ලැබුනු” දැවැන්ත අවස්ථාවක්” ලෙස ය. දකුනු ආසියාව තුල සිය අවශ්‍යතා හඹා යාම පිනිස ඉන්දියාවේ ම්ලේච්ඡ ජනඝාතනය තුලින් ඊට සමාන අවස්ථාවක් ලැබී ඇති බව දැන් වොෂිංටනය දකී.

රයිස් නව දිල්ලියේ සිටිය දී, එක්සත් ජනපද ඒකාබද්ධ මිලිටරි ප්‍රධානීන්ගේ කාර්ය මන්ඩලයේ සභාපති අද්මිරාල් මයික් මුලන්, ඉස්ලාමාබාද්හි සංචාරයක යෙදෙමින්, පකිස්ථානයේ අට මස් වියැති සිවිල් ආන්ඩුව හා රටේ මිලිටරි අන දෙන නිලධාරින් මත පීඩනය යොදමින් සිටියේය.

“පකිස්ථානයේ පාදකව සිටින කන්ඩායම්වලට පැවතිය හැකි මොන යම් හෝ සියලු සබඳතා ආක්‍රමනශීලී ලෙස පරීක්ෂාවට ලක් කරන” ලෙස ජනාධිපති අසිෆ් අලි සර්දාරිගේ ආන්ඩුවෙන් ඉල්ලා සිටිමින්, මුලන් නව දිල්ලියේ දී රයිස් කල ප්‍රකාශ ප්‍රතිරාවය කලේය. කෙසේ වෙතත්, අද්මිරාල් තවත් දුර ගියේ, පකිස්ථාන ආන්ඩුවට “රටේ අන් ප්‍රදේශවල සිටින සටන්කාමී අන්තවාදීන්ට එරෙහිව තවත්, වඩා තියුනු ක්‍රියාමාර්ග ගැනීමට” සිදුව ඇතැයි ප්‍රකාශ කරමිනි.

මෙම අවසන් සැඳහුම පැහැදිලිව ම, හත් වසරක් පැරනි එක්සත් ජනපද මිලිටරි වාඩිලෑමට එරෙහිව සටන් වදින ඇෆ්ඝනිස්තාන බලවේගවලට සහයෝගය දී ඇති, වසිරිස්ථානයේ, ෆෙඩරල් පාලනයට යටත් ග්‍රෝතික ප්‍රදේශවල සහ ඇෆ්ඝනිස්ථානයට යාබද සෙසු භූමි ප්‍රදේශවල, සිය මෙහෙයුම් උත්සන්න කිරීමට පකිස්ථාන මිලිටරිය ක්‍රියා කල යුතු බවට කෙරෙන ඉල්ලීමකි. ඇමරිකානු මිලිටරිය, මිසයිල ප්‍රහාර මෙන් ම කොමාන්ඩෝ ප්‍රහාර ද එල්ල කරමින් පකිස්ථාන සිවිල් වැසියන් ඝාතනය කරමින්, මෙම ප්‍රදේශවල තමන්ගේ ම ප්‍රහාර නැවත නැවතත් සිදු කර තිබේ.

ඇෆ්ඝනිස්ථානයේ යුද්ධයට සහයෝගය පිනිස එය ඉටු කරන ක්‍රියාකලාපය වඩා සඵල ලෙස ඉටු කරන ලෙස පකිස්ථානයට අඩන්තේට්ටම් කිරීමටත් එය අසාර්ථක වුව හොත් තමන්ගේ ම මැදිහත්වීම උත්සන්න කිරීම යුක්තියුක්ත කිරීමටත් අවස්ථාවක් ලෙස වොෂිංටනය මුම්බායි සිද්ධීන් දකින බව පෙනී යයි.

මේ සම්බන්ධයෙන් අර්ථභාරී තීරු ලිපියක් අගහරුවාදා *වොෂිංටන් පෝස්ට්* පත්‍රයේ පල විය. එය ලියා තිබුනේ ඉරාක යුද්ධයේ ප්‍රමුඛ උද්ඝෝෂයකු හා බුෂ් පාලනාධිකාරය සමග සමීප සබඳතා සහිත පුද්ගලයකු වන රොබර්ට් කගාන් විසිනි. පකිස්ථානය ආක්‍රමනය කිරීමත් " කාශ්මීරය තුල මෙන් ම ග්‍රෝතික ප්‍රදේශවල ද ත්‍රස්තවාදී කඳවුරු මුලිනුපුටා දැමීමත්" පිනිස ජාත්‍යන්තර හමුදාවක් තනන ලෙස කගාන් ඉල්ලා සිටියේය.

එවන් මිලිටරි මැදිහත්වීමක් සඳහා තර්ක කරමින් කගාන් ප්‍රකාශ කර සිටින්නේ, එය " පකිස්ථානය ද ත්‍රස්තවාදීන්ට සෙවන දෙන සෙසු රාජ්‍යයන් ද සිය ස්වෛරී භාවය කොහොමටත් තමන්ට හිමි දෙයක් ලෙස නොගත යුතු ය යන මූලධර්මය තහවුරු කිරීම ආරම්භ කිරීමට එක්සත් ජනපදයට, යුරෝපයට හා සෙසු ජාතීන්ට ප්‍රයෝජනවත් වනු ඇති" බවයි. " 21 වන සියවසේ දී ස්වෛරී අයිතීන් උපයා ගත යුතුය."

මුම්බායි ප්‍රහාරවලට දක්වන " ප්‍රතිචාරය ජාත්‍යන්තරකරනය කිරීමේ" එවන් පියවරකට " ඉන්දියාව හා පකිස්ථානය අතර සෘජු මිලිටරි ගැටුමක් වලක්වාලීමේ වාසිය ගෙන ඒමේ හැකියාව ඇත" යයි කගාන් තර්ක කරයි.

අවසානයේ දී, ඔහු අවධාරනාත්මකව කියා සිටින්නේ, " ඔවුන්ට එල්ල වන ප්‍රහාරවලට අප සලකන්නේ අප ම වෙත එල්ල වන ප්‍රහාරවලට අප සලකන බැරෑරුම් භාවයෙන් ම යුතුව ය යන්න ඉන්දියානු ජනතාවට ප්‍රදර්ශනය කිරීමේ වගකීම" එක්සත් ජනපදයට පවතින නිසා මේ ආකාරයේ මැදිහත්වීම් අවශ්‍ය බවයි.

එනයින් ගත් කල, 9/11 මුම්බායි සමග සම්බන්ධ කිරීමේ ප්‍රයත්නය ද මෙම ඇඳීමේ සම්පූර්න ඇඟවුම් ද වඩාත් පැහැදිලිව ප්‍රකාශය පත් කෙරෙයි. 2001 ප්‍රහාර මෙන් ම, ඉන්දියාව තුල ත්‍රස්තවාදී ක්‍රියාවන් දකිනු ලබන්නේ ද නව ආක්‍රමනික යුද්ධයක් සඳහා කඩතුරාවක් ද ඓතිහාසිකව පරිපීඩිත රාජ්‍යයක ස්වෛරී භාවය රුදුරු ලෙස පාගා දැමීම යුක්තියුක්ත කිරීමක් ද ලෙස ය.

කගාන් අනතුරු අඟවන ඉන්දියාව හා පකිස්ථානය අතර මිලිටරි ගැටුමක විය හැකියාව, කලාපය තුල එක්සත් ජනපද අධිරාජ්‍යවාදයේ මැදිහත්වීම මගින් තවත් වැඩි කරනු ලැබ ඇත.

එවන් යුද්ධයක් එක්සත් ජනපදයේ මූලෝපායික අවශ්‍යතාවන්ට බැරෑරුම් තර්ජනයක් මතු කරයි. එනම්, පකිස්ථානය, ඇෆ්ඝනිස්ථානය සමග වන එහි බටහිර දේශසීමාවේ එය දැන් රඳවා ඇති හමුදා සේනාංක ඉවත් කර ගෙන ඒවා ඉන්දියාව දෙසට නැගෙනහිරට යැවීමට ඉඩ ඇති බැවිනි. එවිට එම දේශසීමා කලාපය ද ඇෆ්ඝනිස්ථානයේ එක්සත් ජනපද හා නැටෝ හමුදාවන්ට වෙත කෙරෙන ප්‍රධාන සැපයුම් මාර්ග ද අනාරක්ෂිත වනු ඇත.

මනුෂ්‍ය වර්ගයා සම්බන්ධයෙන් ගත හොත්, එවන් යුද්ධයක් න්‍යෂ්ටික ගැටුමක හා මිලියන ගනනක ජීවිත විනාශ වීමේ අන්තරාය මතු කරයි.

මෙම අර්බුදය දිග හැරෙන්නේ, එක්සත් ජනපදයේ ඊලඟ ජනාධිපති ලෙස බරක් ඔබාමා දිවුරුම් දීමට යන්තම් සති හයක් තිබිය දී ය. අන් අවස්ථාවල මෙන් මෙහි දී ද, " පලුදුවලින් තොර සංක්‍රමනයක" යනු කුමක් ද යන්න පෙරදැකිය හැකි බවට දර්ශක පවතී. සිය පාලනාධිකාරයේ ඉහල ප්‍රමුඛතාවක් ලැබෙනු ඇත්තේ ඇෆ්ඝනිස්ථානයේ යුද්ධය උත්සන්න කිරීම සහ එය පකිස්ථානය තුලට ම දීර්ඝ කිරීමට ය යන්න ඔබාමා නැවත නැවතත් පෙන්නුම් කර ඇත.

සිය ජාතික ආරක්ෂක කාර්ය මන්ඩලය හඳුන්වා දෙමින් පසුගිය සඳුදා පැවති සිය ප්‍රවෘත්ති සාකච්ඡාවේ දී, ඔබාමා " ත්‍රස්ත විරෝධී යුද්ධයේ" භාෂාව මුලුමනින් ම වැලඳ ගත්තේ, එක්සත් ජනපද ආක්‍රමනය යුක්තියුක්ත කරනු වස් ජෝර්ජ් ඩබ්ලිව්. බුෂ් යටතේ යොදා ගැනුනු නරුම කඩතුරාවන් ම තමන් ද යොදා ගන්නා බව පෙන්නුම් කරමිනි.

**බිල් වැන් ඕකන්**

© www.wsws.org